## Government Notification

## Special Commodity Levy Act, No. 48 of 2007

## Order under Section 2

1. By virtue of the powers vested in me under Section 2 of the Special Commodity Levy Act No. 48 of 2007, I, Ranil Wickremesinghe, Minister of Finance, Economic Stabilization and National Policies of the Democratic Socialist Republic of Sri Lanka, do by this order impose in respect of the commodities specified in Column I of the Schedule hereto a Special Commodity Levy at the rate specified in the corresponding entries in Column II of that Schedule.

**SCHEDULE**

| Column I | | | | Column II |
|---|---|---|---|---|
| Commodity Item | | | | Special Commodity Levy |
| | H. S. Heading | H.S .Code | Description | |
| 1. | 07.13 | | Black gram: | |
| | | 0713.31.22 | Skinned, whether or not split | Rs. 300 per Kg |
| | | 0713.31.29 | Other | Rs. 300 per Kg |
| 2. | | 0713.31.19 | Other – Green gram (Moong) | Rs. 300 per Kg |
| 3. | | 0713.35.90 | Other – Cowpeas | Rs.300 per Kg |
| 4. | 10.05 | 1005.90 | Maize | Rs. 25 per kg |
| 5. | 10.08 | 1008.21.10 | Seed – Kurakkan (Eleusine coracana spp.) | Rs.300 per Kg |
| | | 1008.21.90 | Seeds – Other (Millet) | Rs.300 per Kg |
| | | 1008.29.10 | Other - Kurakkan (Eleusine coracana spp.) | Rs.300 per Kg |
| | | 1008.29.90 | Other (Millet) | Rs.300 per Kg |

2. Importation of Maize, Black gram, Green gram, Cowpeas and Kurakkan as described above shall be allowed on recommendation of the Ministry of Agriculture.

3. The Order made under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007 and published in the Extraordinary Gazette Notification No. 2321/76 of March 04, 2023 in respect of importation of Cowpeas (HS Code 0713.35.90) and Kurrakkan / Other –Millet (HS Codes 0713.35.90,1008.21.10,1008.21.90,1008.29.10,1008.29.90) is hereby rescinded with effect from February ..20.., 2024.

4. The Order of the above shall be valid until December 31, 2024 commencing from February ..20..,., 2024 subject to provisions of Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007.

**Ranil Wickremesinghe**
**Minister of Finance, Economic Stabilization and National Policies**

February ..19..,, 2024
Ministry of Finance, Economic Stabilization and National Policies
Colombo 01.

## රජයේ නිවේදනයයි

### 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

### 2 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ (I) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (II) තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

උපලේඛනය

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතාංකය | විස්තරය | |
| 1. | 07.13 | | උඳු: | |
| | | 0713.31.22 | පිට කුරුට්ට ඉවත් කළ, පියළි කළ හෝ පියළි නොකළ | කි.ග්‍රෑමයට රු.300.00 |
| | | 0713.31.29 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු.300.00 |
| 2. | | 0713.31.19 | අනෙකුත් – මුං ඇට | කි.ග්‍රෑමයට රු.300.00 |
| 3. | | 0713.35.90 | අනෙකුත් – කව්පි | කි.ග්‍රෑමයට රු.300.00 |
| 4. | 10.05 | 1005.90 | බඩඉරිඟු | කි.ග්‍රෑමයට රු.25.00 |
| 5. | 10.08 | 1008.21.10 | බීජ – කුරක්කන් (ඉලියුසිනේ කොරකානා විශේෂ) | කි.ග්‍රෑමයට රු.300.00 |
| | | 1008.21.90 | බීජ – අනෙකුත් (මිලට්) | කි.ග්‍රෑමයට රු.300.00 |
| | | 1008.29.10 | අනෙකුත් - කුරක්කන් (ඉලියුසිනේ කොරකානා විශේෂ) | කි.ග්‍රෑමයට රු.300.00 |
| | | 1008.29.90 | අනෙකුත් (මිලට්) | කි.ග්‍රෑමයට රු.300.00 |

2. ඉහත සඳහන් කර ඇති බඩ ඉරිඟු, උඳු, මුං ඇට, කව්පි හා කුරක්කන් ආනයනය කිරිම කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශය මත සිදු කළ යුතුය.

3. කව්පි (සං.ව.සංකේතාංක 0713.35.90) සහ කුරක්කන්/ අනෙකුත් - මිලට් (සං.ව.සංකේතාංක 0713.35.90,1008.21.10,1008.21.90,1008.29.10,1008.29.90) ආනයනය කිරීමට අදාළව 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ 2023 මාර්තු 04 දිනැති

අංක 2321/76 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත නියමය 2024 පෙබරවාරි 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

4. මෙම නියමය, 2024 පෙබරවාරි මස 20 වැනි දිනෙන් ආරම්භ වී 2024 දෙසැම්බර් 31 වැනි දින දක්වා 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

**රනිල් වික්‍රමසිංහ**
**මුදල්, ආර්ථික ස්ථායිකරණ**
**සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය**

2024 පෙබරවාරි මස 19 වැනි දින
කොළඹ 01
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.